www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාන විප්ලවයේ ඛේදවාචකය

## The Tragedy of the Iranian Revolution

**2009 පෙබරවාරි 11**

මීට තිස් වසරකට ඉහත දී අද වැනි දිනක, එක්සත් ජනපදයේ අනුග්‍රහය ලැබූ ඉරානයේ ෂා රජුගේ ඒකාධිපති තන්ත්‍රය මහජන නැගිටීමක් හමුවේ කඩාවැටුනි.

1979 ජනවාරි මැද ඉරානයෙන් පලා ගොස් තිබූ ෂා පෙරලා දැමීම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට වැදුනු දැවැන්ත ප්‍රහාරයක් විය. ෂා රේශා පලාවි මොනර සිහසුන මත පිහිටුවාලූ 1953 සීඅයිඒ කුමන්ත්‍රනය තෙක් අතීතයට දිවෙන සියවස් කාර්තුවක කාල පරිච්ඡේදයක් තිස්සේ, වොෂිංටනය ඔහුගේ ආඥාදායකත්වයට අනුග්‍රහය දැක්වූයේ හා එය සන්නද්ධ කලේ, ඉරානය තෙල් සම්පතින් අනූන මැද පෙරදිග තුල එක්සත් ජනපදයේ පොලිස් රාජ්‍යය බවට පත් කරමිනි.

1977 අග දී, එක්සත් ජනපද ජනාධිපති ජිමී කාටර් ෂාගේ ලේ නාගත් තන්ත්‍රය "ස්ථාවරත්වයේ ක්ෂේම භූමිය" ලෙස ප්‍රකාශයට පත් කලේය. එහෙත් ඉරානය ඉක්මනින් ම මහජන විරෝධතාවන්ගෙන් සොලවාලනු ලැබීය. 1978 වසර ඉදිරියට යද්දී, දශ ලක්ෂ සංඛ්‍යාත ඉරාන වැසියෝ වැඩෙන විරැකියාවට හා උද්ධමනයට ද රාජ සභාවේ සාමාජිකයන් හා ඔවුන්ගේ හෙන්චයියන් රටේ තෙල් ධන සම්පත් කිසිදු වගවිභාගයක් නැතිව විවෘතව කොල්ලකෑමට ද අන් සියල්ලටමත් වඩා රාජාන්ඩු ආඥාදායකත්වයට ද විරෝධය පානු වස් ටෙහෙරානයේ හා සෙසු ප්‍රධාන නගරවල වීදිවලට ගලා ආහ. ඉරාන ජනතාවට, ෂා යනු හුදෙක් අත්තනෝමතික හා දූෂිත පාලනයේ පමනක් නොව සියවසක් තිස්සේ අධිරාජ්‍යවාදය තමන්ගේ රට මත පටවා තිබූ සමස්ත අපකීර්තියේ හා ප්‍රචන්ඩත්වයේ ද ප්‍රතිමූර්තිය විය.

දරුනු මර්දනය -- එක දිනක දී (1978 සැප්තැම්බර් 8) විරෝධතාකරුවන් 1600ක් වෙඩි තබා මරා දමන ලදි -- අසහනය මැඩපැවැත්වීමට අපොහොසත් විය. කම්කරු පන්තිය, සිය පන්ති අරගලයේ විධික්‍රම වන වර්ජන හා වැඩපොල වාඩිලාගැනීම් යොදා ගනිමින්, එලඹෙන විප්ලවය පිටුපසින් සිටින ප්‍රධාන සමාජ බලවේගය ලෙස, වඩවඩාත්, ඉස්මතු විය. අවසානයේ දී, ෂා තන්ත්‍රයේ පිටකොන්ද බින්දේ තෙල් කම්කරුවන්ගේ වර්ජනයයි.

ෂා පෙරලාදැමීමෙන් ඉක්බිතිව, විප්ලවය පුපුල් විය. කම්කරුවන් කම්හල් ද ගොවීහු ඉඩම් ද අල්ලා ගත්හ. 1917 රුසියාවේ තත්වයට සමාන්තර තත්වයක් ඇතිවීම පැහැදිලිව දැකගත හැකි විය.

එහෙත් 1917 මෙන් නොව, රාජ්‍ය බලය ඉරාන කම්කරුවන්ගේ අත්වලට මාරු නොවීය. ඒ කම්කරු පන්තියේ නායකත්වය යටතේ ගොවි ජනතාව හා සුලු ධනේශ්වරයේ සෙසු කොටස් රැලි කර ගැනීමට ද සැබෑ ජාතික විමුක්තිය අත්පත් කරගැනීමේ හා ඉරාන වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා ජයගැනීමේ එකම විධික්‍රමය ලෙස සමාජවාදී විප්ලවයේ ක්‍රියාමාර්ගය ඉදිරිපත් කිරීමට ද විප්ලවවාදී කම්කරු පක්ෂයක්, බොල්ෂෙවික් පක්ෂයක්, නොතිබූ නිසාය.

ඒ වෙනුවට, විප්ලවයෙන් මතුවුනේ, කම්කරු පන්තිය ක්ෂමා විරහිත ලෙස මැඩපවත්වා ධනේශ්වර පර්යාය පුනස්ථාපනය කොට ධනපති දේපොල ආරක්ෂා කල ඉස්ලාම් ජනරජයකි, පූජකයන්ගේ නායකත්වයෙන් යුක්ත ධනේශ්වර ජාතිකවාදී තන්ත්‍රයකි. 1983 වන විට, බොහෝ සෙයින් ඊටත් බෙහෙවින් පෙරාතුව, තන්ත්‍රයෙන් ස්වාධීන සියලු වෘත්තීය සමිති සහ සියලු වාමාංශික සංවිධාන, තහනම් කොට ශාරීරිකව ම බිඳ දමන ලදි.

දිගු කලක් තිස්සේ තමන් සමග සහජීවී සබඳතාවක් පවතින බසාර් වෙලෙන්ඳන්ගේ පිටුබලය ලද ෂියායිට් පූජකයෝ ඉහල ම මට්ටමේ දේශපාලන තත්වයකට හිමිකම් කීමට සමත් වූහ. "ඉස්ලාම් ධර්මයට නොගැලපෙන" නීති අහෝසි කිරීමට, "පව්කාර" පාර්ලිමේන්තු අපේක්ෂකයන් ඉවත් කිරීමට හා තමන් අතරින් රටේ "අධ්‍යාත්මික නායකයා" තෝරාගැනීමට ජ්‍යෙෂ්ට පූජකයන්ට බලය ලැබුනි. කාන්තාවන්ගේ සහ ජනවාර්ගික හා ආගමික සුලුතරයන්ගේ අයිතීන්, පාගා නොදැමුනු අවස්ථාවන්හි දී, සීමා කෙරුනි.

විප්ලවයෙන් ක්ෂනිකව ඉක්බිතිව ප්‍රදානය කෙරුනු, බෙහෙවින් සීමිත සමාජ ප්‍රතිසංස්කරන මුලුමනින් ම පාහේ යලි උදුරා ගැනුනි. 1990 ගනන් මුල වන විට, මුල්ලාවරු අත්‍යවශ්‍ය භාන්ඩ සඳහා දුන් සහනාධාර කප්පාදු කිරීමේ, ෂාගෙන් හා ඔහුගේ ඥාතිමිත්‍රාදීන්ගෙන් අල්ලා ගැනුනු සමාගම් පුද්ගලීකරනය කිරීමේ සහ විශේෂ ආර්ථික කලාප හා සෙසු සහන සහිතව විදේශ ආයෝජකයන් ආකර්ෂනය කර ගැනීමේ යෙදී ගත්හ.

වත්මන් ඉරානය ෂා පාලනය යටතේ පැවතුනාට නොඅඩු මට්ටමෙන්, සමාජ අසමානතාව, දරිද්‍රතාව හා ආර්ථික අනාරක්ෂිත භාවය මගින් සංලක්ෂිත වී තිබේ. තන්ත්‍රය වතාවතක් ලෙස එක්සත් ජනපදය" මහා සාතන් " ලෙස ගුනාංගීකරනය කරන නමුත්, එය ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද ආක්‍රමන හා මිලිටරි වාඩිලෑම් සමග සහයෝගී වී තිබේ.

ඉරාන විප්ලවයේ ඛේදවාචකය නම්, ෂා ආඥාදායකත්වයට එරෙහි අරගලය තුල එයට පැවති සමාජ භාරයට අනුරූපී වන ආකාරයේ දේශපාලන ක්‍රියාකලාපයකට හිමිකම් කීමට කම්කරු පන්තිය අපොහොසත් වීමයි.

මේ සම්බන්ධයෙන් ස්ටැලින්වාදය මුලුමනින්ම වගකිව යුතුය.

ඉරාන කොමියුනිස්ට් පක්ෂයට නැත හොත් තුදේ පක්ෂයට ඉරාන කම්කරු පන්තිය තුල ගැඹුරු මූලයන් පැවතුනි. 1940 ගනන්වල දී එය මහජන ව්‍යාපාරයක නායකත්වය ලෙස මතු වූ අතර, 1944-1947 දී සහ යලිත් 1953 දී, බලය සඳහා අභියෝග කිරීමක් එයට කල හැකිව තිබුනි. එහෙත්, කල් පසුවුනු ධනේශ්වර වර්ධනයක් සහිත රටවල දී, කම්කරු පන්තිය කිසිදු ස්වාධීන කාර්ය භාරයක් ඉටු කිරීමේ අභිලාෂයක් ඇති කර නොගත යුතු අතර කල යුත්තේ ජාතික ධනේශ්වරයට "සිය" විප්ලවය ඉටු කිරීමට සහාය දීම පමනක් ය යන අදහස දැරූ මෙන්ෂේවික්-ස්ටැලින්වාදී අවධි දෙකේ විප්ලව න්‍යායෙන්, සෝවියට් නිලධරය විසින්, තුදේ පක්ෂය උගන්වනු ලැබ තිබුනි.

1953 අගෝස්තුවේ දී සිය ප්‍රධාන ධනේශ්වර සගයා වූ ඉරාන අගමැති මොසඩෙක් එක්සත් ජනපද පීඩනයට හිස නමා, රාජකීය විරෝධී මහජන විරෝධතා මඩිනු පිනිස හමුදාව කැඳවූ කල, ස්ටැලින්වාදියෝ දැවැන්ත ව්‍යාකුලත්වයකට ඇද වැටුනහ. එනයින්, ඔවුහු ඉන් දින දෙකකට පසුව සීඅයිඒ සංවිධානය විසින් සැලසුම් කෙරුනු මොසඩෙක් පෙරලාදැමීමේ කුමන්ත්‍රනයට කිසිදු ප්‍රතිරෝධයක් නොදැක්වූහ.

ඊලග 25 වසර තිස්සේ, ස්ටැලින්වාදීන් තවත් දකුනට ගමන් කලේ, ෂා සමග දබර කරගත් කවර හෝ ජෙනරාල්වරයකු හෝ දේශපාලනඥයකු සමග හාදකම් ඇති කරගනිමින් සහ ඔහු ව්‍යවස්ථාදායක රාජාන්ඩුවක් බවට පත් වන්නේ නම් ෂා තන්ත්‍රයේ පැවැත්ම සමග තමන්ම සංහිඳියාවට පත්වී ගනිමිනි.

මේ අතරතුර, සෝවියට් හා චීන ස්ටැලින්වාදී නිලධරයෝ පලාවි රාජ වංශය සමග පුලුල් රාජ්‍යතාන්ත්‍රික හා වානිජ සබඳතා වර්ධනය කර ගත්හ. ෂාට එරෙහි තත්වාරක්ෂක හා සම්ප්‍රදායික කොටස්වල විරුද්ධත්වය සමග බැඳුනු අයතුල්ලා රුහොල්ලා කොමේනි 1970 ගනන්වල දී අධිරාජ්‍යවාදී අනුග්‍රහය ලද ෂාගේ ආඥාදායකත්වයේ ප්‍රමුඛතම හා වඩාත් ම දෘඩතර විරුද්ධවාදියා ලෙස තමන්ව මූර්තිමත් කර ගැනීමට සාර්ථක ලෙස සමත් වූයේ නම්, ඒ ප්‍රගතිශීලී ආඥාදායකයකු බවට පත් වන ලෙස ෂාට නිරතුරුවම බැගෑපත් වූ අපකීර්තිමත් ධනේශ්වර දේශපාලනඥයන්ට කම්කරු පන්තිය යටත් කල ස්ටැලින්වාදීන්ගේ දශක ගනනාවක පිලිවෙත නිසාම පමනි.

1978-1979 කාලයේ දී ෂා තන්ත්‍රයට එරෙහිව පැන නැගි මහජන නැගිටීම හමුවේ තුදේ පක්ෂය සිටියේ මුලුමනින්ම නුසූදානම් තත්වයකය. එහි ප්‍රතිචාරය වූයේ කොමේනිට හා මුල්ලාවරුන්ට අනුගත වීමයි. තුදේ පක්ෂය ඉස්ලාම් ජනරජයක් තැනීමට සහයෝගය දී කොමේනි තන්ත්‍රය ස්වාධීන කම්කරු පන්තික ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව මර්දනය කරන විට පවා එයට දිගටම සහාය දුන් අතර එම තන්ත්‍රයේ ව්‍යාජ-වාමවාදී ඉස්ලාම් පූච්චානම් නිතරම පාහේ ප්‍රතිරාවය කලේය.

කොමේනි විසින් වර්ධනය හා ප්‍රචාරය කරන ලද ෂියා ඉස්ලාම් ධර්මයේ ජනතාවාදී රූපාකාරය විවිධාකර ක්‍රියාකාරිත්වයන් වෙනුවෙන් සේවය කලේය. එය සූරාකෑම සඳහා තමන්ට පවතින හැකියාවන් සීමා කල නිසා අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට හා ෂාගේ ඥාති සංග්‍රහ ධනවාදයට වෛර කල බසාර් වෙලෙන්දන්ගේ හා සෙසු දේපොල හිමි ස්ථරවල අවශ්‍යතා ද එය තමන්ගේ පන්ති පීඩනයේ කොටු පවුර නිසා ෂා තන්ත්‍රයට එරෙහිව සටන් කල ඉරාන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ රැඩිකල් ලෙස ප්‍රතිවිරුද්ධ අවශ්‍යතා ද අතර පවතින වෙනස ව්‍යාකුල කිරීමට එම ජනතාවාදී රූපාකාර උදව්කාරක විය. එය "දෙවියන්ගෙන් තොර" මාක්ස්වාදයට එරෙහි වඩවඩා ප්‍රචන්ඩ වන ප්‍රහාරයක් සඳහා තියුනු තුඩ විය. අවසන් එහෙත් වැදගත්කමෙන් අඩු නොවන කාරනාව වූයේ, එය, නව තන්ත්‍රය සිය දේපොල ආරක්ෂා කරනු ඇති බවට ධනේශ්වරයට දෙන සහතිකයක් ලෙස ද සේවය කල බවයි. කොමේනි මෙසේ ප්‍රකාශ කලේය:" ඉස්ලාම් ධර්මය පවතින තාක් කල් නිදහස් ව්‍යවසාය පවතිනු ඇති."

ෂාට එරෙහි මහජන නැගිටීම පාලනය කිරීමේ ද අධිරාජ්‍යවාදයට පීඩනය දැමීම පිනිස එය යොදා ගැනීමේ ද විධික්‍රමයක් ලෙස කොමේනි අධිරාජ්‍ය විරෝධී හා තෙවන ලෝකවාදී පූච්චානම්වල පිහිට පැතීය. නිව් යෝර්ක් නුවරට පැමිනීමට ෂාට අවසර දීමේ කාටර් පාලනාධිකාරයේ ප්‍රකෝපකාරී තීන්දුවට ප්‍රතිචාරයක් වූ, එක්සත් ජනපද තානාපති කාර්යාලය අල්ලාගැනීම යොදා ගනු ලැබුවේ, තන්ත්‍රයේ විප්ලවවාදී

අක්තපත්‍ර ප්‍රදර්ශනය කිරීම ද කොමේනි තන්ත්‍රය විවේචනය කිරීමට නැමුනු ඕනෑම කෙනෙකු එක්සත් ජනපදය සමග සිය ගැටුමේ දී ඉරානය දුර්වල කරන්නකු ලෙස හෙලාදැකීම ද පිනිසය. ඒ අතරතුර, තිරයට පිටුපසින්, ඉරාන බලධාරිහු එක්සත් ජනපද සංස්ථාපිතය සමග උපාමාරු දමමින්, 1980 එක්සත් ජනපද මැතිවරනයට පෙරාතුව ප්‍රාන ඇපකරුවන් නිදහස් නොකිරීමට රිපබ්ලිකන් ජනාධිපති අපේක්ෂක රොනල්ඩ් රේගන්ගේ රහස් ඒජන්තයන් සමග රහස් ගිවිසුමක් ගසාගැනීමේ යෙදී ගත්හ. ඉන් තෙවසරකට පසුව, කොමේනි තන්ත්‍රය තුදේ පක්ෂයට එරෙහිව හැරී ගත් විට, එය එසේ කලේ සීඅයිඒ සංවිධානය විසින් සපයන ලද රහස් ඔත්තු තොරතුරු යොදාගනිමිනි.

1980 සැප්තැම්බර් සිට 1988 අගෝස්තු දක්වා, කොමේනි තන්ත්‍රය, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ක්‍රියාකාරී දිරිගැන්වීම ද ලැබ, සදාම් හුසේන්ගේ ඉරාකය සමග යුද්ධයක නිමග්න විය. එම යුද්ධය දෙරටේම ජනතාව සඳහා ව්‍යසනකාරී ප්‍රතිවිපාක ගෙනඒමට නියමිත විය. මුල්ලාවරු මෙම ප්‍රතිගාමී යුද්ධය ගෙන ගියේ ද්විත්ව අරමුනු ඇතිවයඃ එනම්, මහජනතාවගේ විමුක්තිකාමී ප්‍රාර්ථනා බිඳවැටීමත් සමග ඉරානය තුල පැනනැගි සමාජ වෛරය හා අසහනය බාහිර සතුරකුට එරෙහිව හරවා යැවීම සහ කලාපීය බලවතා ලෙස තමන්ව තහවුරු කරගැනීමට ඉරාන ධනේශ්වරයට දිගුකලක් තිස්සේ පැවති අභිලාෂයන් සාක්ෂාත් කරගැනීම ය.

වොෂිංටනය ගනන් නොගෙන සිටීම හා එයට අභියෝග කිරීම පවා සිය අවශ්‍යතාවන්ට ගැලපෙන දෙයක් ලෙස ඉස්ලාම් ජනරජයේ පාලකයන් යලියලිත් දැක ඇති අතරම, ඔවුහු ජර්මනිය, ජපානය හා සෙසු අධිරාජ්‍යවාදී බලවතුන් ගනනාවක් ම සමග ලාභදායි සබඳතා වර්ධනය කරගෙන තිබේ. එමෙන්ම, එය සිය අඩන්තේට්ටම් හා තර්ජන නතර කරන්නේ නම් පමනක්, වොෂිංටනය සමග ගිවිසුමක් ඇති කර ගැනීමට පවත්නා ඔවුන්ගේ සූදානම ඉරාන තන්ත්‍රය තුල සිටින වැදගත් කොටස් නැවත නැවතත් සංඥා කර තිබේ.

ඉරාන කම්කරුවන්, තරුනයන් සහ සමාජවාදී-හිතැති බුද්ධිමත්තු, කොල්ලකාරී එක්සත් ජනපද හා යුරෝපා අධිරාජ්‍යවාදීන්ට කිසිදු සහනයක් දීමෙන් තොරව, ඉරානයේ 1979 අධිරාජ්‍ය විරෝධී විප්ලවය ගබ්සා කිරීමෙන් උපන් ප්‍රතිගාමී තන්ත්‍රයට ක්ෂමා විරහිතව විරුද්ධ විය යුතුය.

කම්කරු පන්තියේ නව පක්ෂයක්, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ඉරාන ශාඛාවක්, ට්‍රොට්ස්කිවාදී නොනවතින විප්ලව ක්‍රියාමාර්ගයේ පදනම මත ගොඩනැගිය යුතුය. කල්පසු වූ ධනවාදී වර්ධනය සහිත රටවල දී, අධිරාජ්‍යවාදයෙන් නිදහස් වීම ද වැඩවසම්වාදයේ සියලු ඉතිරිපහඳු අහෝසි කිරීම හා රාජ්‍යයෙන් ආගම වෙන්කිරීම ඇතුලු, ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ මූලික කර්තව්‍යයන් සම්පූර්න කිරීම ද සාක්ෂාත් කරගත හැකි වන්නේ, කම්කරු පන්තියේ නායකත්වයෙන් යුක්ත සමාජවාදී විප්ලවයක් හරහාම පමනි.

**කීත් ජෝන්ස්**

© www.wsws.org